# කාර්යසාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

# 2014

## කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்

## DEPARTMENT OF MANAGEMENT AUDIT

| | | |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය | நிதி அமைச்சு | Ministry of Finance |
| මහලේකම් කාර්යාලය | செயலகம் | The Secretariat |
| කොළඹ 01 | கொழும்பு 01 | Colombo 01 |

*රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හි උපදෙස්වලට අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය මෙමගින් ඉදිරිපත් කෙරේ.*

## පටුන


**පිටු අංකය**

01. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යයන් 02

02. මූල්‍ය පරිපාලනය 04

03. භෞතික කාර්යසාධනය 05

3.1 අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කරලීම 05
3.2 අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ සැපයීම 05
3.3 විගණන හා කළමනාකරණ කමිටු සඳහා භාණ්ඩාගාර නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම 06
3.4 මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය 06
3.5 භාණ්ඩාගාර දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල කළමනාකරණ විගණනය 07
3.6 විශේෂ විමර්ශන හා විගණන කටයුතු 07

04. මානව සම්පත් සංවර්ධනය හා පොදු පරිපාලනය 10
4.1 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 10
4.2 කාර්ය මණ්ඩලය 11
4.3 2014 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු 12
4.3.1 2014 වර්ෂයේ විදේශීය පුහුණු අවස්ථා 12
4.3.2 2014 වර්ෂයේ දේශීය පුහුණු අවස්ථා 13

## 01. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යයන්

### දැක්ම

ඉහළම කාර්යසාධනයකින් හා වගවීමකින් යුත් රාජ්‍ය සේවයක් උදෙසා වටිනාකම් එකතුකරන විශිෂ්ඨතම කළමනාකරණ විගණන කොටස්කරු බවට පත්වීම.

### මෙහෙවර

කළමනාකරණ විගණනය තුලින් රාජ්‍ය සේවයේ වගවීම ඉහළ නැංවීම හා වටිනාකම් එකතු කිරීම සඳහා ස්වාධීන හා අරමුණු කරා ලඟාවීම සහතික කෙරෙන උපදේශාත්මක සේවා සැපයීම.

### අරමුණු

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයෙහි ඵලදායීත්වය ඉහල නැංවීම සඳහා දායකවීම.
2. විගණන හා කළමනාකරණ කමිටු මගින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම.
3. කළමනාකරණ විගණනය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හඳුන්වා දීම.
4. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය මගින් ඉහළ කළමනාකාරිත්වයට සහායවීම.
5. සංවර්ධන ව්‍යාපෘතීන්හී කළමනාකරණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
6. විශේෂ විමර්ශන කටයුතු තුලින් රාජ්‍ය අංශයේ සිදුවන හා සිදුවිය හැකි අක්‍රමිකතා අනාවරණය කිරීම හා එවැනි තත්ත්වයන් හා සිදුවීම් වළක්වා ගැනීමට නිර්දේශයන් සහ නිවාරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

## කාර්යයන්

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයේ ගුණාත්මකභාවය හා කාර්යක්‍ෂමතාවය ඉහළ නැංවීම සඳහා මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.

2. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ ඒ යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ විගණනයට භාජනය කිරීම.

3. අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදීම.

4. අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධීකරණය හා අවශ්‍ය මගපෙන්වීම් කිරීම.

5. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ අභ්‍යන්තර විගණන කුසලතා දියුණු කිරීම.

6. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම සහ අනෙක් අමාත්‍යාංශවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා මඟපෙන්වීම.

7. රාජ්‍ය අංශය අනුගමනය කරන අවදානම් ඇගයීමේ ක්‍රමවේදයේ ප්‍රමාණාත්මක බව ඇගයීම.

8. විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම.

## 02. මූල්‍ය පරිපාලනය

2014 අයවැය ඇස්තමේන්තුව මගින් වැය ශීර්ෂ 324 වැඩසටහන අංක 01 ව්‍යාපෘතිය 01 යටතේ මෙම දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබිණි. 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සැකසීමේදී 2014 වර්ෂයේ ප්‍රතිපාදන සංශෝධනය කෙරුණි. එම ප්‍රතිපාදන වැය කළ ආකාරය පහත දැක්වේ.

| වියදම් විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම (රු.) | සංශෝධිත ඇස්තමේන්තු වෙන්කිරීම (රු.) | මු.රෙ. 66 හා 69 අනුව මාරු කිරීම් (රු.) | තත්‍ය වියදම (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම් (අ)** | **26,675,000** | **26,300,000** | **-** | **24,645,919** | **1,654,081** |
| පුද්ගල පඩිනඩි | 17,800,000 | 17,500,000 | 1,74,307 (1,74,307) | 17,111,035 | 388,965 |
| අනෙකුත් වියදම් | 8,875,000 | 8,800,000 | 65,333 (65,333) | 7,534,884 | 1,265,116 |
| **මූලධන වියදම් (ආ)** | **1,600,000** | **1,600,000** | **-** | **1,324,583** | **275,417** |
| 2001 ගොඩනැගිලි හා ඉදිකිරීම් | - | - | - | - | - |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 200,000 | 200,000 | - | 197,950 | 2,050 |
| 2003 වාහන | 200,000 | 200,000 | - | 38,000 | 162,000 |
| 2102 කාර්යාලීය උපකරණ | 200,000 | 200,000 | - | 193,428 | 6,572 |
| 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000 | 500,000 | - | 449,800 | 50,200 |
| 2401 හැකියා වර්ධනය | 500,000 | 500,000 | - | 445,405 | 54,595 |
| **මුළු එකතුව (අ) + (ආ)** | **28,275,000** | **27,900,000** | **-** | **25,970,502** | **1,929,498** |

- **2014 වර්ෂයේ පරිපූරක ප්‍රතිපාදන නොමැත.**

### රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම

2014 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අනුමත අත්තිකාරම් 'බී' ගිණුමේ විස්තර පහත දැක්වේ.

| විස්තරය | අනුමත සීමාව (රු.) | තත්‍ය වියදම (රු.) |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | 3,000,000 | 1,913,255 |
| අවම ලැබීම් සීමාව | 1,250,000 | 1,675,683 |
| උපරිම හර ශේෂ සීමාව | 10,000,000 | 7,268,597 |

# 03. භෞතික කාර්ය සාධනය

## 3.1. අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කරලීම

අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්තව සිටින අභ්‍යන්තර විගණකවරුන්ගේ වෘත්තීය දැනුම ඉහළ නැංවීමට හා විගණනය පිළිබඳව කාලීන තොරතුරු ලබාදීමට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නිරතුරුවම කටයුතු කරයි. එම අරමුණ ඇතිව 2014 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් වැඩමුළු පවත්වන ලදී.

| දිනය | වැඩමුළුවේ මාතෘකාව | සහභාගි වූ අය |
|---|---|---|
| 2014.03.17 | රාජ්‍ය ආයතනවල ක්‍රියා පටිපාටීන්ගේ ප්‍රමාදයන් හා ව්‍යුහමය අකාර්යක්ෂමතාවය අවම කරලීමේ වැඩමුළුව | අමාත්‍යාංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / දෙපාර්තමේන්තුවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් |
| 2014.10.28 | ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ගොඩනැගීම සඳහා වූ පුහුණු වැඩමුළුව | අමාත්‍යාංශ / පළාත්සභා / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / දෙපාර්තමේන්තුවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් |
| 2014.11.07 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කාර්ය සාධනය ඉහළ නැංවීම පිළිබඳ පුහුණු වැඩමුළුව | උතුරු පළාත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා පළාත්සභා කාර්යාලවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් |
| 2014.12.30 | පරිගණක වැඩසටහන් විගණනය හා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංවිධානය කිරීමේ පුහුණු වැඩමුළුව | අමාත්‍යාංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / දෙපාර්තමේන්තු ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් |

## 3.2 අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ සැපයීම

පහත සඳහන් ක්ෂේත්‍රයන්හි විගණන කටයුතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කිරීම අරමුණු කර ගෙන අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීමට අවශ්‍ය මූලික කෙටුම්පත් සකස් කිරීම අවසන් කර ඇත.

3.2.1. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ක්‍රියාත්මක විවිධ වැඩසටහන්වල ආර්ථික කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය පරීක්ෂා කිරීම සඳහා කාර්යසාධන විගණනය (Performance Audit) පිළිබඳ මාර්ගෝපදේශය.

3.2.2. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විශේෂ විමර්ශන පැවැත්වීම සඳහා වන මාර්ගෝපදේශය. දැනට එම විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව වඩාත් නිපුණතාවයක් ඇති අභ්‍යන්තර විගණකවරුන් හා අනෙකුත් පාර්ශවයන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගෙන, එම කෙටුම්පත්වල අවශ්‍ය සංශෝධනයන් සිදු කර ගෙන යනු ලබන අතර එළඹෙන වර්ෂය තුළදී මෙම මාර්ගෝපදේශයන් නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

## 3.3. විගණන හා කළමනාකරණ කමිටු සඳහා භාණ්ඩාගාර නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම

රජයේ අමාත්‍යාංශයන්හි විගණන හා කළමනාකරණ කමිටුවල භාණ්ඩාගාර නියෝජිත ලෙස මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වේ. එම නිලධාරීන් විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ඵලදායීව හා අඛණ්ඩව පැවැත්වීම පිළිබඳව මාර්ගෝපදේශ සැපයීම හා අධීක්ෂණය කිරීම් සිදුකර ඇත. එමෙන්ම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක ශක්තිමත් කිරීමටත්, අභ්‍යන්තර විගණන වාර්තා හා රජයේ විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති විශේෂ කරුණු සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගැනීමටත් අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතුකර ඇත. තවද කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කිරීමද මගින් රාජ්‍ය අංශයේ කළමනාකරණ කටයුතු ශක්තිමත් කිරීමට දායකත්වය සපයා ඇත.

චක්‍රලේඛ විධිවිධාන අනුව 2014 වසර තුළ අමාත්‍යාංශ 58 ක පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 208 කටද, දෙපාර්තමේන්තු 03 ක පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 09 කටද, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, අග්‍රාමාත්‍ය කාර්යාලය, ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව යන රාජ්‍ය ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 16 කටද මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වී ඇත.

## 3.4 මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවලට අදාළ කළමනාකරණ විගණනය සිදු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් සේ සැලකේ. 2014 වර්ෂයේදී ද මෙම කාර්යය සාර්ථකව සිදු කළ අතර, ඒ අනුව සෑම ආයතනයක් වෙනුවෙන්ම කාර්තුවකට එක් කළමනාකරණ විගණන වාර්තාවක් බැගින් කළමනාකරණ විගණන වාර්තා 04 ක් නිකුත් කර ඇත. එමගින් එම ආයතනවල කාර්යක්ෂම හා ඵලදායී අභ්‍යන්තර පාලන විධි ක්‍රම පවත්වාගෙන යාමටත් ඒ තුළින් වඩාත් ඉහළ කාර්යසාධනයක් ළඟාකර ගැනීමටත් පිටුවහලක් ලැබී ඇත.

01. ජාතික අයවැය දෙපාර්තමේන්තුව
02. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
03. රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
04. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
05. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

06. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

07. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

08. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

09. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

10. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

11. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

12. නීති කටයුතු  දෙපාර්තමේන්තුව

13. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

14. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

15. ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව

## 3.5. භාණ්ඩාගාර දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල කළමනාකරණ විගණනය

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යභාරයට මහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු විසින් ක්‍රියාත්මක කරන විදේශාධාර පාදක සංවර්ධන ව්‍යාපෘතීන්හි කළමනාකරණ විගණන කටයුතු ද ඇතුලත්ය.

ඒ අනුව, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියහි (SMEDeF) කළමනාකරණ විගණන කටයුතු අඛණ්ඩව 2014 වර්ෂයේදී සිදු කරන ලදී.

## 3.6 විශේෂ විමර්ශන හා විගණන කටයුතු

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වශයෙන් අතිගරු  ජනාධිපතිතුමාට සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්තුමාට ලැබෙන මහජන පැමිණිලි  පරීක්ෂා කර වාර්තා කිරිම සඳහා කළමනාකරන විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබයි. එසේ යොමු කරනු ලදුව ඉටුකරන ලද පරීක්ෂණයන්ගේ වාර්තාව භාණ්ඩාගාර ලේකම්ගේ  උපදෙස් මත ඉදිරි කටයුතු සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ අදාල ආයතනයේ ප්‍රධානින් හට යොමු කරනු ලබන අතර විමර්ශනය අනුව හෙළිදරව්වන අඩුපාඩු සහ අක්‍රමිකතා නැවත ඇතිවීම වළක්වා ගැනීම මෙහි අරමුණ වේ.

**2014 වර්ෂයේදි කළමනාකරන විගණන දෙපාර්තමේන්තුව මගින් විමර්ශන කටයුතු අවසන්කර ඇති විමර්ශන සංඛ්‍යාව 12 කි.**


| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 01 | තක්සේරු දෙපාර්තමේන්තුව | තක්සේරු නිලධාරින් නීති විරෝධී ලෙස පුද්ගලික බැංකුවල සහ පුද්ගලික මූල්‍ය ආයතනවල තක්සේරු මණ්ඩලයට සම්බන්ධවීම. |
| 02 | වෘත්තීය තාක්‍ෂණ විශ්ව විද්‍යාලය | වාහන බලපත්‍ර ලබා ගැනීමේදී වංචනික කටයුතු සිදුකර තිබීම |
| 03 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | සහකාර සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා සැපයුම් - කොන්ත්‍රාත් පදනම) විසින් කරඇති අක්‍රමිකතා |
| 04 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (හලාවත ඩිපෝව) | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගණකාධිකාරීවරිය රාජ්‍ය මුදල් අයථා ලෙස පරිහරණය කිරිම |
| 05 | ජාතික රුධිර මධ්‍යස්ථානය | පැමිණිමේ ලේඛන කූට ලෙස සකස් කිරීම. |
| 06 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | වර්තමාන සභාපතිගෙන් සිදුවන අකටයුතුකම් |
| 07 | ජලසම්පාදන හා ජලප්‍රවාහන අමාත්‍යාංශය | දූෂණ සහ අක්‍රමිකතාවයන් |
| 08 | සුරාබදු දෙපාර්තමේන්තුව | ප්‍රධාන ගණකාධිකාරී මහතා කරඇති දූෂණ සහ මූල්‍ය අක්‍රමිකතා |
| 09 | භාණ්ඩාගාර දෙපාර්තමේන්තු | භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල ක්‍රීඩා සහ සුබසාධන කටයුතු වෙනුවෙන් අරමුදල් රැස්කිරීම. |
| 10 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ගොඩනැගිලි කොන්ත්‍රාත්, මිලදී ගැනිම් හා ප්‍රචාරණ කටයුතු වලින් අයථා ලෙස කොමිස් මුදල් ලබා ගැනීම |
| 11 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ දූෂණ වංචා හා අක්‍රමිකතා. |
| 12 | යළි පිබිදෙමු ව්‍යාපෘතිය (ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය) | Poly net house ඉදිකිරිමට අදාල අක්‍රමිකතා |

**2014 වර්ෂය අවසන්වන විට ඉදිරියට යමින් පැවති විමර්ශන කටයුතු**

| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 01 | වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය - රත්මලාන | විශ්ව විද්‍යාලය සතු අරමුදල් අවභාවිතය. |
| 02 | පරමාණුක බලශක්ති අධිකාරිය | මෝටර් රථ ආනයන බලපත්‍ර වංචා සහගත ලෙස ලබා ගැනීම |
| 03 | කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | කොළඹ කොමර්ෂල් පොහොර සමාගම තුල සිදුවී ඇති අක්‍රමිකතා |
| 04 | ජාතික ලොතරැයි මණ්ඩලය | සාමාන්‍යාධිකාරී විසින් කරනු ලබන අකටයුතුකම් |
| 05 | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සේවකයකු රත්‍රං කි.ලෝ. 3ක් රටතුලට රැගෙන ඒම සම්බන්ධයෙන් කළ රේගු විමර්ශනයේදී සිදුවූ අසාධාරණය |

## 04. මානව සම්පත් කළමනාකරණය හා සාමාන්‍ය පරිපාලනය

### 4.1. දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය




කාර්යාල සේවක සේවය– 4; රියදුරු -5; පර්යේෂණ සහකාර - 1 (ජනාධිපති කාර්යාලයට අනුයුක්ත)

නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂක; ප්‍ර.රා.ක. - ප්‍රධාන රාජ්‍ය කළමණාකරණ සහකාර ; ස.නි. - සංවර්ධන නිලධාරී; ක.ස. - කළමනාකරණ සහකාර

## 4.2. කාර්ය මණ්ඩලය 2014.12.31 දිනට

| තනතුර | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ප.සේ.) | 01 | - | 01 |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ග.සේ.) | 05 | 05 | - |
| අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ක්‍ර.සේ.) | 02 | 02 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ග.සේ.) | 07 | 01 | 06 |
| පර්යේෂණ සහකාර / සංවර්ධන සහකාර | 06 | 05 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 14 | 12 | 02 |
| රියදුරු | 07 | 05 | 02 |
| කාර්යාල සේවක සේවය | 04 | 04 | - |
| **එකතුව** | **48** | **36** | **12** |

### 2014 වර්ෂයේ ස්ථාන මාරු ලැබ දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරීන්

| | නම | තනතුර |
|---|---|---|
| 1. | ඩබ්.කේ.එච්. ප්‍රියන්තා විතාන මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 2. | ටී.ඩී.එන්.ඩී. රන්දෙණිය මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 3. | පී.ඩබ්.බී.එම්. විමලචන්ද්‍ර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 4. | එස්.ඩී.එම්. ඩයස් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 5. | එල්.ඒ.එම්.පී.කේ. අභයරත්න මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 6. | පිවිනි විජේවර්ධන මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 7. | ඩබ්.ඩී.එස්.කේ. අලගියවන්න මිය | සංවර්ධන නිලධාරී |
| 8. | එස්.එම්.ටී. නිරාශා මිය | සංවර්ධන නිලධාරී |
| 9. | කේ.ජේ. කුමාරසිංහ මයා | රියදුරු |
| 10. | කේ.පී. වසන්ත මයා | රියදුරු |
| 11. | කේ.ඩී.එස්. සෙනෙවිරත්න මයා | රියදුරු |
| 12. | ඒ.පී. නාලක චන්දන මයා | කාර්යාල සේවක සේවය |

## 2014 වර්ෂයේ දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවී ගිය නිලධාරීන්

| | නම | තනතුර |
|---|---|---|
| 1. | චම්පිකා රණසිංහ මිය | අධ්‍යක්ෂ ( ශ්‍රී.ලං.ප.සේ.) |
| 2. | ටී.ඩී.එන්.ඩී. රන්දෙණිය මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 3. | එල්.ඒ.එම්.පී.කේ. අබයරත්න මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 4. | ඒ.කේ.එස්. බෝදිකා නන්දනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 5. | කේ.ඒ.බී.එම්. ගුණරත්න මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 6. | කේ.ඩී.එස්. සෙනෙවිරත්න මයා | රියදුරු |
| 7. | කේ.ජී.ද සිල්වා මහතා | රියදුරු |
| 8. | ආර්.එන්.ඩබ්ලිව්. මුදලිගේ මයා | කාර්යාල සේවක සේවය |

## 2014 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරීන්

| | නම | තනතුර |
|---|---|---|
| 1. | බී.ඩී.එස්. චන්ද්‍රලාල් මයා | රියදුරු |

## 4.3. 2014 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු

### 4.3.1. 2014 වර්ෂයේ විදේශීය පුහුණු අවස්ථා

| නිලධාරියාගේ නම | තනතුර | පැවැත් වූ රට | පුහුණු පාඨමාලාව / වැඩසටහන | කාලය |
|---|---|---|---|---|
| එස්.එම්. දයාරත්න | අධ්‍යක්ෂ | ඉතාලිය | World Congress of Accountants | 2014.11.10 - 2014.11.13 |

### 4.3.2. 2014 වර්ෂයේ දේශීය පුහුණු අවස්ථා

| පුහුණු පාඨමාලාව / වැඩසටහන | පුහුණු කාලය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|---|
| දෙමළ භාෂා පුහුණුව | ජන. 08 සිට අඟ. දිනවල | එච්.ඩී.පී. සරත් කුමාර මයා | රියදුරු |
| ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පරිපාටික රීති | පෙබ. 19 - 21 | එච්.ඩී.ඩී.එස්. ගුණසේකර මිය | ප්‍රධාන කළමනාකරණ සහකාර |
| ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම් | ජුනි 23 | ඊ.එම්.ජී.එල්. ඒකනායක මිය<br>පී.ඩබ්.බී.එම්. විමලචන්ද්‍ර මයා | කළමනාකරණ සහකාර |
| English Conversation for Professionals | ජුලි 24 සිට මාස හතරකි | වී අයි. දිල්හානි මෙය | සහකාර අධ්‍යක්ෂ |
| Master of Financial Economic | වසර 1 | ඒ.එන්. හපුගල මයා | අධ්‍යක්ෂ |
| දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | සැප්.20 - ඔක්. 01 | එච්.ඩී.පී. සරත් කුමාර මයා | රියදුරු |
| රජයේ නිලධාරීන්ට අදාල නීතිමය විධිවිධාන | අගෝ. 26 | කේ.ඒ.එම්.එච්. කපුවත්ත මිය<br>ජී.ඩී.කේ. ලියනගේ මිය | සංවර්ධන නිලධාරී<br>කළමනාකරණ සහකාර |
| මුදල් රෙගුලාසි 104 පරීක්ෂණ පැවැත්වීම | සැප්. 26 | ජී.ඩී.කේ. ලියනගේ මිය | කළමනාකරණ සහකාර |
| දෙමළ භාෂා පුහුණුව | සැප්. 26 සිට බදාදා හා සිකුරාදා | පී.ඩබ්.බී.එම්. විමලචන්ද්‍ර මයා | කළමනාකරණ සහකාර |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප හා කළමනාකරණය | ඔක්. 09 - 13 | කේ.ආර්.ආර්. ප්‍රනාන්දු මිය<br>ජී.ඩී.කේ. ලියනගේ මිය | කළමනාකරණ සහකාර |
| Seminar on Taxation Proposals of the Budget 2015 | නොවැ.20 | කේ.ඒ.එම්.එච්. කපුවත්ත මිය<br>ජී.ඩී.කේ. ලියනගේ මිය | සංවර්ධන නිලධාරී<br>කළමනාකරණ සහකාර |
| Microsoft Office and Email - Workshop | නොවැ. 26 | ඩී.යූ.එස්. වික්‍රමආරච්චි මයා<br>එම්.ඒ.කේ.පී. විජේවන්ත මිය<br>එස්.එම්. දයාරත්න මයා<br>ඒ.එන්. හපුගල මයා<br>ඒ.කේ. ගුණසේකර මෙය | අති.අධ්‍යක්ෂ ජනරාල්<br>අධ්‍යක්ෂ |
| Diploma in English for Professionals | දෙසැ. 18 සිට | එස්.එම්. දයාරත්න මයා | අධ්‍යක්ෂ |